“දැහැමි ක්රියාවන් ඉටු කිරීමේදී අල්ලාහ්ට වඩාත් ප්රියා මනාප දිනයන් වනුයේ මෙම දිනයන් මිස වෙනත් නැත.” එනම් දින දහයයි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “දැහැමි ක්රියාවන් ඉටු කිරීමේදී අල්ලාහ්ට වඩාත් ප්රියා මනාප දිනයන් වනුයේ මෙම දිනයන් මිස වෙනත් නැත.”
එනම් දින දහයයි. ඔවුහු: ‘අල්ලාහ්ගේ දූතයාණනි! අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කිරීමත්
(ඊටත් වඩා ප්රිය මනාප) නොවන්නේ ද’ යැයි විමසා සිටියෝය. එතුමා: “අල්ලාහ්ගේ
මාර්ගයේ අරගල කිරීම ද නැත. නමුත් තම ජීවිතය හා තම ධනය කැප කරමින් පිටත්ව ගොස්, ඒ කිසිවක් සමග නැවත හැරී නො එන මිනිසා හැර” යැයි පැවසූහ. [صحيح] [رواه البخاري وأبو داود، واللفظ له]

දුල් හිජ්ජා මාසයේ ආරම්භක දින දහයේ දැහැමි ක්රියාවන්හි නිරත වීම වසරේ සෙසු දිනයන්ට වඩා ඉතා ශේර්ෂ්ඨය යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහැදිලි කර සිටියි. මේ දිනවල හැර වෙනත් දිනවල අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කිරීම උතුම් ද එසේ නැතහොත් මේ දිනවල සිදු කරන ක්රියාවන් උතුම් ද? යන්න ගැන සහාබාවරු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් විමසා සිටියහ. ඊට හේතුව ක්රියාවන් අතරින් සත්යය වෙනුවෙන් අරගල කිරීම ශේර්ෂ්ඨ බව සහතික වී තිබුණු බැවිනි. එවිට එතුමාණන්: මේ දිනවල දැහැමි ක්රියාවන්හි නිරත වීම සෙසු දිනවල අල්ලාහ්ගේ මාර්ගයේ සත්යය වෙනුවෙන් අරගල කිරීමට වඩා උතුම් බවත්, නමුත් පුද්ගලයකු තම ජීවිත හා ධනය කැප කරමින් අල්ලාහ්ගේ මාර්ගයේ නිරත වී පසුව ඔහුගේ ධනය මෙන්ම ඔහුගේ ජීවිතය අල්ලාහ්ගේ මාර්ගයේ අහිමි කරගත් තැනැත්තෙකු හැර බවත් පිළිතුරු දුන්හ. මෙම උතුම් දිනවල දැහැමි ක්රියාවන් සිදු කිරීමේ ශේර්ෂ්ඨත්වය මෙය පෙන්වා දෙයි.

http://www.sunnah.global/hadeeth/si/show/6255